2027 වර්ෂය සඳහා කළමනාකරණ සේවා නිලධාරි සේවයේ

අභ්‍යන්තර වාර්ෂික අභියාචනා මණ්ඩල රැස්වීම - 2026.10.14

මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

කළමනාකරණ සේවා නිලධාරි සේවයේ නිලධාරීන්ගේ අභ්‍යන්තර වාර්ෂික අභියාචනා මණ්ඩල රැස්වීම 2026.10.14 දින පෙ.ව. 09.30 ට අමාත්‍යාංශයේදී පහත නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් පවත්වන ලදී.

අභියාචනා මණ්ඩලය :

එම්.ඒ. රණවක මිය - සභාපති
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්

ඊ.එම්.යූ.එස්. ඒකනායක මයා - සමාජික
ප්‍රධාන ගණකාධිකාරී

බී.බී.අයි.ඒ. පෙරේරා මිය - සමාජික
අධ්‍යක්ෂ

වෘත්තිය සමිති නියෝජිතයින් :

කේ.එස්.කේ. ග්‍රේරු මහතා - ප්‍රධාන භාණ්ඩාගාරික
සමස්ත ලංකා රාජ්‍ය කළමනාකරණ සහකාර සංගමය

චම්ල රත්නසේකර මහතා - නි. ප්‍රධාන ලේකම්
රජයේ කළමනාකරණ සේවා සංගමය

2027 අභ්‍යන්තර වාර්ෂික ස්ථාන මාරු තීරණ වලට අදාලව ඉදිරිපත් කර තිබූ අභියාචනා සහ ඒ සඳහා අභියාචනා මණ්ඩලය විසින් ලබා දෙන ලද තීරණ පහත පරිදි වේ.

	අභියාචනය	ඉදිරිපත් කර ඇති නිලධාරියා	අභියාචනා මණ්ඩල තීරණය
1	අමාත්‍යාංශ විෂය පථයට අයත් නොවූ කාලසීමාව තුළ ආනයන හා අපනයන දෙපාර්තමේන්තුව වෙත පැමිණි නිලධාරීන් දෙපාර්තමේන්තුව අමාත්‍යාංශ විෂය පථයට අයත් වූ දිනට ජ්‍යෙෂ්ඨතා ලේඛනයට ඇතුළත් කරගැනීම (නිලධාරිනිය 2029.12.03 දින රාජ්‍ය සේවයෙන් විශ්‍රාම යාමට නියමිත බව දන්වා ඇත)	එන්.කේ.ජී.කේ. නාගසිංහ මිය - භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව	අමාත්‍යාංශ විෂය පථයට අයත් නොවූ කාලසීමාව තුළ ආනයන හා අපනයන දෙපාර්තමේන්තුව, රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව හා ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව වෙත පැමිණි නිලධාරීන් 2023.12.31 දිනට ජ්‍යෙෂ්ඨතා ලේඛනයට ඇතුළත් කිරීමට ගෙන ඇති තීරණයේ වෙනසක් සිදුනොවන බව දැනුම් දෙන ලදී.

වෙනත් විශේෂ කාරණා

	කාරණය	අභියාචනා මණ්ඩල තීරණය
1	රේගු අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක AB/1B/1/MSO/ඒ.සේ.ස්,මා./2026 හා 2026.08.13 දිනැති ලිපියෙන් දන්වා ඇති පරිදි 2027 වසරේ රේගු දෙපාර්තමේන්තුවෙන් පිටතට ස්ථාන මාරුවී යාමට නියමිත එන්.එල්. චමිලා මිය කළමනාකරණ සේවා නිලධාරී සේවයේ අධි ශ්‍රේණියට උසස් කර පත්වීම් ලැබීමට නියමිත බැවින් එම නිලධාරිනිය පත්වීම් ලද පසු එම පුරප්පාඩුව සම්පූර්ණ කර දෙන ලෙස කර ඇති ඉල්ලීම සලකා එම නිලධාරිනිය 2027.01.01 දිනට යොදා ඇතත් 2027 වාර්ෂික ස්ථාන මාරු ලේඛනයේ එම නිලධාරිනිය 2026.06.01 එනම් ඇය රේගු දෙපාර්තමේන්තුවේ සේවා කාලය වසර 05 සම්පූර්ණ වන දිනට ස්ථාන මාරුවීම ලබා දී ඇත. ඒ අනුව ඇයගේ අනුප්‍රාප්තික නිලධාරියා පැමිණෙන්නේ 2027.06.01 දිනට වන බැවින් ඒ පිළිබඳව අවධානය යොමු කරන ලදී	එන්.එල්. චමිලා මිය කළමනාකරණ සේවා නිලධාරී සේවයේ අධි ශ්‍රේණියට පත්කිරීම මෙම වසර තුලදී සිදුවිය හැකි බැවින් කළමනාකරණ සේවා නිලධාරී සේවයේ වාර්ෂික අභ්‍යන්තර ස්ථාන මාරුවීම් යටතේ රේගු දෙපාර්තමේන්තුව වෙත ස්ථාන මාරුවීමේ ලේඛනය - 2027 දැනට සංශෝධනය කිරීම අවශ්‍ය නොවන බවත්, පත්වීම් දිනය තීරණය වූ පසු එම දිනය සලකා බලා විධිමත්ව සංශෝධනය කරන ලෙසත් දන්වන ලදී

එම්.ඒ. රණවක්ක මිය
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික
සංවර්ධන අමාත්‍යාංශය

එම්.ඒ. රණවක්ක
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය
කොළඹ 01

ඊ.එම්.යූ.එස්. ඒකනායක මයා
ප්‍රධාන ගණකාධිකාරී
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික
සංවර්ධන අමාත්‍යාංශය

ඊ.එම්.යූ.එස්. ඒකනායක
ප්‍රධාන ගණකාධිකාරී
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික
සංවර්ධන අමාත්‍යාංශය

බී.බී.අයි.ඒ. පෙරේරා මිය
අධ්‍යක්ෂ
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික
සංවර්ධන අමාත්‍යාංශය

අනුරාධි පෙරේරා
අධ්‍යක්ෂ (රාජ්‍ය)
ආයතනික කටයුතු අංශය
මුදල්, ක්‍රමසම්පාදන
ආර්ථික සංවර්ධන අමා...
කොළඹ 01